"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."


ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011-2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2092601
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / தொலைபேசி / General Telephone 011-2093000


| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. CSWP/ADM/18-38/FI/01-2019 | ඔබේ අංකය. / உமது இல. / Your No. | දිනය. / திகதி. / Date. 2019-02-01 |

**පළාත් චක්‍රලේඛ : 02/2019**

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
සභා ලේකම්(බ.ප),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව-බ.ප.),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

<u>බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ දෙවන ශ්‍රේණියට උසස් කිරීම.</u>

2018.03.06 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි අංක 01/2018 චක්‍රලේඛ ලිපිය බස්නාහිර පළාත් සභාවට පහත පරිදි අනුගත කර ගෙන ඇත.

01. ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1898/5 හා 2015.01.19 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 2013.04.02 දින සිට ක්‍රියාත්මක වූ බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10 වගන්තිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවනු ලැබේ. එම වගන්තිය යටතේ වන 10.1.1.1 අනුවගන්තියේ vi දරණ උප වගන්තිය අනුව එම සේවයේ III ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම අපේක්ෂකයන් විසින් සපුරාලිය යුතු සුදුසුකමක් බව දැක්වේ.

02. එබැවින් 2007.07.01 දිනට පසු බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර III ශ්‍රේණියට පත්වීම් ලද නිලධාරීන් සාමාන්‍ය කාර්ය සාධනය මත II ශ්‍රේණියට උසස්වීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2014 අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය සම්පූර්ණ කර ඇති බවට සනාථ කෙරෙන ලිපියේ සහතික කළ පිටපතක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත යොමු කළ යුතු බව කාරුණිකව දන්වමි.

03. උසස් වීම් කටයුතුවලදී සිදුවන අනවශ්‍ය ලිපි හුවමාරුව සහ ප්‍රමාදයන් වැළැක්වීම සඳහා අත්‍යවශ්‍ය වන මෙම කාරණය සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන ලෙසද වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

<u>*පිටපත*</u> : 01. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel: 011-2092606<br>Fax: 011-2092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 011-2092631<br>Fax: 011-2092647<br>dcspt@cs.wpc.gov.lk | Tel: 011-2092640<br>Fax: 011-2092636<br>csfinance@wpc.gov.lk | Tel: 011-2092532<br>Fax: 011-2092533<br>dsplancs@wpc.gov.lk | Tel: 011-2092501<br>Fax: 011-2092505<br>dsengcs@wpc.gov.lk | Tel: 011-2092628 |